**2023-09-25 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **කැලෑ ගිනි ඇති වීම වැළැක්වීම හා පාලනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම**

මිනිසා විසින් වනාන්තර ආශ්‍රිතව සිදු කරන ගිනි තැබීම් නිසා විශේෂයෙන්ම වියළි කාලගුණික තත්ත්වයක් පවතින අවස්ථාවලදී කැලෑ ගිනි ඇති වීමේ අවදානම සීඝ්‍රයෙන් ඉහළ යාමේ ප්‍රවණතාවක් පවතී. බදුල්ල, මහනුවර, නුවරඑළිය, මාතලේ, මොනරාගල, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල මෙම තත්ත්වය බහුලව දක්නට ඇත. මෙම වර්ෂය තුළ මේ දක්වා කැලෑ ගිනි ගැනීම් 150ක් පමණ වාර්තා වී ඇති අතර ඒ හේතුවෙන් හෙක්ටයාර 2,600ක පමණ කැලෑ විනාශ වී ඇත. එබැවින්, ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා වන රාජ්‍ය යාන්ත්‍රණයේ සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන්ගේ සහාය ලබා ගනිමින් කැලෑ ගිනි ඇති වීම වැළැක්වීම සහ ඇති වන ගිනි නිවා දැමීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම පිණිස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සහ ජෝර්ජියා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලෙවන් මයික්ලඩ්සේ රාජ්‍යතාන්ත්‍රික පුහුණු හා පර්යේෂණ ආයතනය අතර අවබෝධතා ගිවිසුම**

විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම, අධ්‍යයන කාර්යමණ්ඩලය හුවමාරු කර ගැනීම, සිසුන් හුවමාරු කර ගැනීම, ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් මෙන්ම ඉගැන්වීමේ ක්‍රමවේදයන් සහ අනෙකුත් අදාළ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සහයෝගිතාව ඇති කර ගැනීම පිණිස විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සහ ජෝර්ජියා විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ලෙවන් මයික්ලඩ්සේ රාජ්‍යතාන්ත්‍රික පුහුණු හා පර්යේෂණ ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී ඇත. ඒ අනුව, දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කර වසර 25ක් සම්පූර්ණ වීම සම්බන්ධයෙන් වන සංවත්සර උත්සවයට සමගාමීව එකී යෝජිත අවබෝධතා ගිවිසුම දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk

www.dgi.gov.lk
www.news.lk

03. **මුතුරාජවෙල ආසන්න මුහුදේ ඛනිජතෙල් ගොඩබෑම සඳහා භාවිත කරනු ලබන නැංගුරම් බෝයාව සඳහා අවශ්‍ය අමතර කොටස් ප්‍රසම්පාදනය කිරීම**

මුතුරාජවෙල ආසන්න මුහුදේ ඛනිජතෙල් ගොඩබෑම සඳහා භාවිත කරනු ලබන නැංගුරම් බෝයාව සඳහා අවශ්‍ය මුහුදේ පාවෙන රබර් නල 26ක් සහ අදාළ අමතර කොටස් ප්‍රසම්පාදනය කිරීම පිණිස ජාත්‍යන්තර තරගකාරී ලංසු ක්‍රමවේදය අනුව ලංසු කැඳවා ඇති අතර ඒ සඳහා එක් ලංසුවක් පමණක් ලැබී ඇත. එකී ලංසුව ඇගයීමට ලක් කළ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි අදාළ ප්‍රසම්පාදනය සිංගප්පූරුවේ M/s Yokahama Industrial Products Asia Pacific (Pte) Ltd. වෙත පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ඉදිරි මාස හතරක (04) කාලය තුළ ඩීසල් නැව් තොග 04ක් මිල දී ගැනීම**

2023-11-01 දින සිට 2024-02-29 දින දක්වා වන ඉදිරි මාස හතරක (04) කාලය තුළ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සඳහා ඩීසල් නැව් තොග 04ක් මිල දී ගැනීම වෙනුවෙන් දීර්ඝකාලීන කොන්ත්‍රාත්තු ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 05ක් ඉදිරිපත් වී තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව M/s Petrochina International (Singapore) Pte. Ltd. වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි නගරයේදී පැවැත්වෙන දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශ්වකරුවන්ගේ 28වන සමුළුව**

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශ්වකරුවන්ගේ 28වන සමුළුව (COP 28) 2023-11-30 දින සිට 2023-12-12 දින දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි නගරයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. එහිදී, දේශගුණික විපර්යාස හේතුවෙන් අනතුරට පාත්‍ර වීමේ වැඩි ඉඩක් පවතින රටවල් සමඟ එක්ව, සංවර්ධනය වෙමින් පවතින රටවල අපේක්ෂාවන් සම්බන්ධව පොදු හඬක් නැඟීමට සහ ඒ සඳහා සංවර්ධනය වූ රටවල පොරොන්දු සහ වගකීම් ඉටු

කිරීමට එම රටවල් යොමු කෙරෙන ආකාරයේ වාතාවරණයක් ඇති කිරීමට හැකි වන පරිදි "දේශගුණ විනිශ්චය සංසදය" (Climate Justice Forum) නමින් ව්‍යුහයක් ඇති කිරීම සඳහා වන යෝජනාවක් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශ්වකරුවන්ගේ 28වන සමුළුවට සහභාගි වන නියෝජිත කණ්ඩායමේ සක්‍රිය සහභාගිත්වය සඳහා රාජ්‍ය මණ්ඩපයක් (Country Pavilion) සමුළුව පැවැත්වෙන කාලය තුළ පවත්වාගෙන යාමටත්, දේශගුණික විපර්යාසවලට අදාළ වන ජාතික මට්ටමේ මූලාරම්භයන් එම මණ්ඩපයේ ප්‍රදර්ශනය කිරීමටත් පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන

සමාජයේ ආබාධ සහිත දරුවන්ගේ යහපැවැත්මට ප්‍රමුඛත්වයක් ලබා දෙමින් ඔවුන්ට පුළුල් රැකවරණයක් ලැබෙන බව සහතික කිරීම පිණිස, නීත්‍යානුකූල ආයතනයක් ලෙස පිහිටුවා ඇති හෝ සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියාත්මක වන ඕනෑම නීතියක් යටතේ ලියාපදිංචි වී ඇති, රජයේ සෞඛ්‍ය සේවා/අධ්‍යාපන පද්ධතිය සමඟ එක්ව එවැනි දරුවන්ට සෞඛ්‍ය පහසුකම් ලබා දෙන ඕනෑම පුණ්‍ය ආයතනයකට බදු සහන ඉල්ලා සිටිය හැකි වන පරිදි දේශීය ආදායම් බද්ද සංශෝධනය කිරීම යෝග්‍ය බවට යෝජනා වී ඇත. ඒ අනුව, ඒ සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කරමින් දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස වැඩබලන මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. ආර්ථික ස්ථායීකරණ සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ප්‍රතිපත්ති පදනම් කර ගත් විශේෂිත ණය පහසුකම් ලබා ගැනීම

ආර්ථික ස්ථායීකරණ සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ උප වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 200 බැගින් වූ ප්‍රතිපත්ති පදනම් කර ගත් ණය පහසුකම් 02ක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ මූලික සාකච්ඡා පවත්වා ඇත. එකී පළමු උප වැඩසටහන යටතේ අර්බුද කළමනාකරණ රාමුව සහ මූල්‍ය අංශයේ ස්ථායීකරණය වැඩිදියුණු කිරීම සඳහා වන කඩිනම් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති

අතර දෙවන උප වැඩසටහන යටතේ ඔරොත්තු දෙන සියල්ල ඇතුළත් මූල්‍ය පද්ධතියක් ගොඩනැගීමට යෝජනා කර ඇත. පළමු උප වැඩසටහන සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් වාර්ෂිකව 2%ක පොලී අනුපාතයක් යටතේ, වසර 05ක සහන කාලයක් ද ඇතුළත් වසර 25ක නැවත ගෙවීමේ කාලයක් සහිතව ලබා ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය ස්ථාපිත කිරීම

2022 වර්ෂයේ අතුරු අයවැය මඟින් ආයතනික ප්‍රතිසංස්කරණයක් ලෙස ස්වාධීන රාජ්‍ය ණය කළමනාකරණ ආයතනයක් ස්ථාපිත කිරීමේ වැදගත්කම අවධාරණය කරනු ලැබ ඇති අතර ණය කළමනාකරණය ඉහළ නැංවීම සහ පාරදෘශ්‍යභාවය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ද ප්‍රමුඛතාගත ක්ෂේත්‍රයන් ලෙස හඳුනාගනු ලැබ ඇත. යෝජිත රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය ස්ථාපිත කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව විසින් තාක්ෂණික සහාය ලබා දී ඇත. අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ණය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සැලසුම, ණය කළමනාකරණ ආයතනික රාමුව සහ නීතිමය රාමුව මේ වන විට සැලසුම් කර තිබේ. ඒ අනුව රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස වැඩබලන මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. 2024 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

2024 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත සකස් කිරීම පිණිස 2023-07-31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති 2024 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********